# 4

ඔබේ වැදගත්ම අවශ්‍යතාවය සපුරාගන්නේ කෙසේද?

SINHALI
GREAT QUESTIONS



# ජීවනය පිළිබඳ ප්‍රධාන ප්‍රශ්න

# දයාබර මිතුර

ඔබ ජාත්‍යන්තර තැපැල් පාඩම් මාලා ආයතනයේ ශිෂ්‍යයෙකුවීම ගැන අපි ඉතාමත් සතුටු වෙමු. ඔබ බොහෝ රටවලින් දහස් ගණනකින් යුත් මහත් වූ ශිෂ්‍ය පිරිසක පංගුකාරයෙකි.

අප මුලින් සඳහන් කළ පරිදි ඔබේ මිත්‍රයින්ටත් අපි මෙම පාඩම් යැවීමට කැමැත්තෙන් සිටිමු. ඔවුන් ගේ නම් සහ ලිපිනයන් මෙහි එකොළොස් වැනි පිටු- වෙහි සඳහන් කරන්න. මෙම පාඩම නැවත අප වෙත ලැබුණු විට මෙම පාඩම් මාලාවේ ප්‍රථම පාඩම අපි ඔවුන්ට තැපැල් කරන්නෙමු.

මේ පාඩම් සඳහා අය කිරීමක් නොවන මුත් ඒවා තැපැල් කිරීමට වියදමක් වේ. එම වියදම සඳහා සහයෝගය දීමට සමහර ශිෂ්‍යයින් කැමතිය. ඔවුන්ගේ සහයෝගය මෙම පාඩම් තවත් ඔබ වැන්නන් අතර බෙද හැරීම පහසු කෙරේ. එවැනි සහයෝගයක් දීමට ඔබත් කැමැත්තෙහි නම් ඊළඟ පාඩම සමග ඔබටද ඒ සම්බන්ධව ක්‍රියාත්මක විය හැකිය.

ඔබ දැන් හොඳින් වැඩ කරගෙන යන්නෙහිය. දැන් මේ සිව්වැනි පාඩමෙන් ඔබේ වැදගත්ම අවශ්‍යතාවය පිරිමසා ගන්නේ කෙසේදැයි ඔබ සොයාගනු ඇත. ඔබ පාඩම් ඉගෙන ගන්නා අතර දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා!

— අධ්‍යක්ෂක,

මෙහි සම්පූර්ණ අයිතිය ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය සතුය.

# 4 වැනි පාඩම

# ඔබේ වැදගත්ම අවශ්‍යතාවය සපුරාගන්නේ කෙසේද?

**ඔබ මෙම පාඩමෙන් ඉගෙනගන්නා දේවල් නම්:**

- ▲ ඔබේ වැදගත්ම අවශ්‍යතාවය කුමක්ද?
- ▲ යේසුස් වහන්සේ විසින් ඔබේ වැදගත්ම අවශ්‍යතාවය පිරිමසාලන්නේ කෙසේද?
- ▲ යේසුස් වහන්සේ ඔබේ ගැළවුම්කාරයාණන්ද?
- ▲ ඔබේ අනෙකුත් අවශ්‍යතාවයන් පිරිමැසෙන්නේ කෙසේද?

පළමුවැනි කොටස

## ඔබේ වැදගත්ම අවශ්‍යතාවය කුමක්ද?

### එය ශරීරය සම්බන්ධවද? ආත්මය සම්බන්ධවද?

කාන්තාරයක නැතහොත් වනාන්තරයක මං මුළාවී සිටින කෙනෙකු හෝ සාගරයේ පහුරක පාවෙමින් සිටින කෙනෙකුට අවශ්‍යවන්නේ කවරකු විසින් හෝ එම තැනැත්තාව සොයාගෙන බේරාගැනීමයි. හාමතේ සිටින කෙනෙකුට ආහාර අවශ්‍යවේ. එමෙන්ම සිරකරුවෙකු හට තමාට නියමවූ දඬුවමින් නිදහස අවශ්‍ය වේ. විෂ ශරීර ගතවූ පුද්ගලයෙකු හට සුවය අවශ්‍ය වේ.

මේ අවශ්‍යතාවයන් ජීවත්වීම සඳහා අවශ්‍ය දේ වුවද ඔබට එයටත් වඩා මහත්වූ අවශ්‍යතාවයක් තිබේ. ඔබේ ශරීරය කෙදිනක හෝ මිය යනු ඇත. නමුත් ඔබේ ආත්මය ප්‍රීතියෙන් සදකාලයට ජීවත්වනු ඇත. නැතහොත් මරණයේ භීතිය හා භයානක කම සදහටම විඳිනවා ඇත. එම නිසා ඔබේ ශරීරයේ ඉතාමත් වැදගත් අවශ්‍යතාවයන්ටත් වඩා ආත්මයට ජීවනයත් සුවයත් අවශ්‍යවේ.



**මතෙව් 10 : 28** ශරීරය නසන නමුත් ආත්මය නසන්ට නුපුළුවන් වූ අයවලුන්ට භය නොවෙල්ලා. එහෙත් ආත්මයද ශරීරයද නිරයෙහි විනාශ කරන්ට පුළුවන්වූ තැනැන්වහන්සේට භය වෙයල්ලා.

## ඔබේ වැදගත්ම අවශ්‍යතාවය ගැළවුම්කාරයෙකි

මනුෂ්‍යයාගේ ආත්මය මුළාව, හාමත්ව මරණාසන්න ලෙස රෝගීව මරණයට නියමව තිබෙන බව බයිබලය අපට කියා දෙයි. මනුෂ්‍යයාට ඔහුව සොයා ගැනීමට, පෝෂණය කිරීමට, සුවකිරීමට සහ ඔහුට කමාව දීමටත් ගැළවුම් කාරයෙකු අවශ්‍යව සිටී. ඔබටම ඔබව ගළවා ගත නොහැකි හෙයින් ඔබේ වැදගත්ම අවශ්‍යතාවය ගැළවුම් කාරයෙකු වේ.

- ක්‍රිස්තියානි දෙමව්පියන් සිටීමෙන් ඔබට ගැළවීම නොලැබේ.
- දේවස්ථානයේ සාමාජිකයෙකු වීමෙන් ඔබට ගැළවීම නොලැබේ.
- යහපත්වීමට උත්සාහ කිරීමෙන් ඔබට ගැළවීම නොලැබේ.
- ගැළවුම්කාරයෙකු නොමැතිව ඔබට ගැළවීම ලැබිය නොහැක.

### ඔබේ අභ්‍යාස සඳහා

- වඩා වැදගත් කුමක්ද ආත්මයද ශරීරයද?...........
- (ඔබේ නම) .................... වන මට බොහෝ අවශ්‍යතාවයන් තිබිය හැකි නමුත් ඒ සියල්ලෙන්ම මගේ වැදගත්ම අවශ්‍යතාවය නම් .............. මන්ද යත් මටම මාව පාපයෙනුත් මරණයෙනුත්........... නොහැකි නිසාය.
- යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඔබේ ගැළවුම්කාරයාණන් හැටියට දැනටමත් ඔබ පිළිගෙන සිටියද මේ පාඩම ඔබට ඉතා වැදගත් වේ. එය උන්වහන්සේ ඔබට ·දිනෙන් දින උපකාර කරන අයුරු කියා දෙයි.

## 2 වැනි කොටස

# යේසුස් වහන්සේ විසින් ඔබේ වැදගත්ම අවශ්‍යතාවය පිරිමසාලන්නේ කෙසේද?

දෙවියන්වහන්සේ විසින් ඔබ උදෙසා එවනු ලැබූ ගැළවුම් කාරයාණන් යේසුස් වහන්සේය.

පාපයේ මුළාවී තිබුණු ඔබේ රෝගාතුරවූ, හාමත්වූ ආත්මය සොයා පෝෂ්‍යකර සුව කිරීමට දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේ එවූ සේක. ඔබේ ස්ථානය ගෙන ඔබ වෙනුවට දිවි පුද ඒ තුළින් ඔබට නිදහස ලබාදෙන පිණිස උන්වහන්සේ මනුෂ්‍යයෙකු වූ සේක. උන්වහන්සේගේ නම යේසුස්වහන්සේ ය. එම නාමයෙහි අර්ථය නම් ගැළවුම්කාරයාණන් යනුය. උන්වහන්සේ පමණක් ඔබව ගැළවීමට හැකිව සිටින සේක.



**මෙය කටපාඩම් කරන්න.**

**ක්‍රියා 4 : 12** වෙන කිසිවෙකු තුළ ගැළවීම නැත්තේය. මක්නිසාද අපේ ගැළවීමට අවශ්‍ය වූ මනුෂ්‍යයන් අතරේ දෙන ලද වෙන කිසි නාමයක් ස්වර්ගයෙන් යට නැත්තේය.

යේසුස්වහන්සේ ඔබට සත්‍යයත්, මාර්ගයත් පෙන්වා දෙන සේක.

සාතන් (යක්ෂයා) අවිශ්වාසයෙන් සහ අසත්‍යයෙන් අපේ මනස අන්ධකර තිබේ. අපි දෙවියන්වහන්සේගෙන් ඈත්ව ගොස් බලයද ඥාණයද යහපත්කම හා ප්‍රේමයද පිළිබඳව අප තුළ සැක පහළ කරවීමට යක්ෂයා උත්සාහ කරයි. සමහරෙක් දෙවි කෙනෙකු සිටින බවත් සැක කරයි.



**2 කොරින්ති 4 : 4** නොඇදහිලිකාරවූ ඔවුන් තුළ ............... මේ ලෝකයේ දෙවියා ඔවුන්ගේ සිත් අන්ධ කළේය.

අපි වැරදි මාර්ගයෙහි සතුට සොයාගෙන ගොස් ඒ වෙනුවට මරණය සොයා ගන්නෙමු.



**හිතෝපදේශ 14 : 12** මනුෂ්‍යයෙකුට හරිව පෙනෙන මාර්ගයක් ඇත. එහෙත් එහි කෙළවරෙහි මරණයේ මාර්ග තිබේ.

සාතන් (යක්ෂයා) බොහෝ දෙනා මුළාකරයි. අපට යහපත් වන්නේ කුමක්ද යන්න සහ වැරදි නිවැරදි පිළිබඳව යක්ෂයා අපට බොරු කියයි. අප විසින් ප්‍රීතියත් සදකාල ජීවනයත් සොයා ගැනීමෙන් සාතන් (යක්ෂයා) අපව වැළැක්වීමට තැත් කරයි.

යේසුස්වහන්සේ යක්ෂයාට වෙනස්ව අපව සොයාගෙන නැවත දෙවියන්වහන්සේ වෙතටත් ප්‍රීතිය සහ සදකාල ජීවනය වෙතටත් අපට මග පෙන්වීම පිණිස පැමිණි සේක. යේසුස්වහන්සේ තුළින්ද උන්වහන්සේගේ ඉගැන්වීම් තුළින්ද ඔබ සත්‍යය උගෙන අවිශ්වාසයෙනුත් අසත්‍යයෙනුත් නිදහස ලබන්නෙහිය.

**මෙය කටපාඩම් කරන්න.**



**යොහන් 14 : 6** යේසුස්වහන්සේ ඔහුට කියන සේක් මාර්ගයද, සැබෑවද, ජීවනයද මමය මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත.

**ලූක් 19 : 10** මක්නිසාද මනුෂ්‍ය පුත්‍රයා නැතිවූදේ සොයාගන්ටද ගළවා ගන්ටද ආසේක.



**යොහන් 8 : 12** මම ලෝකයේ ආලෝකයය. මා අනුව එන්නා අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේය.

**යොහන් 8 : 32** නුඹලා සැබෑව දැනගන්නවා ඇත. සැබෑවද නුඹලා නිදහස් කරන්නේය.

අවංකව සත්‍යතාවය දැනගැනීමට සහ එය අනුගමනය කිරීමට කැමතිව යමෙක් දෙවියන්වහන්සේ වෙතට පැමිණිය හොත් උන්වහන්සේ ඔහුට එය පෙන්වා දෙන සේක. නිදහස් කල්පනාවකින් යුතුව බයිබලය කියවා යාච්ඤා කරන්න දෙවියන්වහන්සේට අවශ්‍ය කරන දේ කිරීමට කැමති වන්න.




**යොහන් 7 : 17** යමෙක් උන්වහන්සේගේ කැමැත්ත කරන්ට කැමති නම් ............ ඒ ඉගැන්වීම ............ දැනගන්නේය.

**රෝම 12 : 2** නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී දෙවියන් වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගතයුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස සිත අළුත් කර ගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා.

### ඔබේ අභ්‍යාසය සඳහා

● යක්ෂයා හෝ යේසුස්වහන්සේ යන වචන දෙකින් එකක් පිළිතුරු ලෙස ලියන්න.

යහපත් දේ ගැන අපව අන්ධකරනු ලබන්නේ කවරෙකු විසින්ද? ...............

අපට දෙවියන්වහන්සේ කුමණ ආකාරද යන්න පෙන්වා දෙනු ලබන්නේ කවරෙකු විසින්ද? ...............

අසත්‍යයෙනුත්, අවිශ්වාසයෙනුත් අපව නිදහස් කරනු ලබන්නේ කවුරුන් විසින්ද? ...............

දෙවියන්වහන්සේගේ වචනය (බයිබලය) පිළිබඳව අප තුළ සැක පහළ කරවන්නේ කවුරුන්ද? ...........

අපව මුළා කරන්නේ කවුද? ...............

### යාච්ඤාව

දෙවියන්වහන්ස මා හට සත්‍යය උගන්වනු පිණිස ඔබගේ පුත්‍රවූ යේසුස් වහන්සේ එවූ නිසා ස්තූති වේවා. ඔබවහන්සේ සැබෑව මට පෙන්වා දී එය අනුගමනය කිරීමට උපකාර කළ මැනව.

ඔබේ මරණීය පාපයෙන් යේසුස්වහන්සේ ඔබව මුදාහරින සේක.

දෙවියන් වහන්සේගේ අණට අකීකරුවීම පාපය බව ඔබ දැනටම ඉගෙනගෙන තිබෙන්නෙහිය. එබැවින් සියල්ලෙන්ම භයානක පාපය දෙවියන්වහන්සේගේ ඉතාම වැදගත් පණතට අකීකරුවීම නොවේද? එය කුමක්දැයි යේසුස්වහන්සේ අපට කියා දුන් සේක.



**මතෙව් 22 : 37–39** ඔබේ මුළු හෘදයෙන්ද, ඔබේ මුළු ආත්මයෙන්ද, ඔබේ මුළු බුද්ධියෙන්ද ඔබේ දෙවිවූ ස්වාමීන්වහන්සේට ප්‍රේම කරනු. මේක උතුම්වූ පළමුවෙනි වූ ආඥාවය. මෙය හා සමාන දෙවැනි එකක්ද තිබේ. එනම් ඔබට මෙන් ඔබගේ අසල්වැසියාට ප්‍රේම කරනු යනුයි.

අපි සියලු දෙනම දෙවියන්වහන්සේගේ වැදගත්ම පනත් දෙක කඩකර ඇත්තෙමු. සියළු පාපයන්ට මුල වන්නාවූ මමත්වය අප සිත්හි පිරී තිබීම නිසා අපගේ ප්‍රේමය යටපත්වී තිබේ. දෙවියන්වහන්සේ අප වෙත දක්වන ප්‍රේමය සම්බන්ධව අපි නොසැලකිලිමත් ලෙස හා අකෘතඥ ලෙස ක්‍රියා කරමු. දෙවියන් වහන්සේටත් අන්‍යයන්ටත් වඩා- අපි අප ගැනම සැළකිලිමත් වෙමු. එබැවින් අප කෙතරම් පව්කාරද? පුද්ගලයින් අතරත් ජාතීන් අතරත් හට ගන්නාවූ සියලුම කරදර නික්මෙනුයේ අපගේ මමත්වයෙන් පූර්ණවූ සිත් වලිනි. පාපය නිසා රෝගී වී තිබෙන ලෝකයෙක අපි ජීවත්වෙමු.



**2 තිමෝති 3 : 2 – 4** මක්නිසාද මනුෂ්‍යයෝ තමුන්ටම ප්‍රේමකරන්නෝව, මුදලට ප්‍රේම කරන්නෝව, පාරට්ටුකරගන්නෝව, උදඞ්කාරයෝව, අපහාසකරන්නෝව, මව්පියන්ට අකීකරු වන්නෝව, ස්තුතිවන්ත නොවන්නෝව, අභක්තිකයෝව, ජන්ම ස්නේහය නැත්තෝව, සමාදනය නොවන්නෝව, කේළාම් කියන්නෝව, තෘෂ්ණාව මැඩපවත්වා නොගන්නෝව, කෲරයෝව, යහපතට ප්‍රේමනොකරන්නෝව, ද්‍රෝහියෝව, හිතුවක්කාරයෝව, අහංකාරයෝව දෙවියන්වහන්සේට වඩා සැප සෙල්ලමට ප්‍රේම කරන්නෝව ............... සිටින්නෝය.

මමත්වය නමැති මරණීය පාපයෙන් ඔබේ ආත්මය මුදහැර ඔබව දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් පූර්ණ කරන පිණිස යේසුස් වහන්සේ වැඩිය සේක.



**1 යොහන් 1 : 9,7** අපේ පාපවල් අපි කියා දෙමු නම් අපේ පව් අපට කමාකරන්ටත් සියළු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක.......... අපිත් ආලෝකයෙහි හැසිරෙමු නම්, අපට එකිනෙකා සමඟ පංගුකාරකම ඇත්තේය. උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස්වහන්සේගේ ලේද සියලු පාපවලින් අප පවිත්‍ර කරන්නේය.



**රෝම 5 : 5**............... ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ හෘදවල වගුරුවන ලද්දේය.

ඔබේ අභ්‍යාස සඳහා

- දෙවියන්වහන්සේගේ වැදගත්ම පණත් දෙක ඔබ කඩකර තිබෙන්නෙහිද?...............
- 2 තිමෝති 3:2–4 (ඉහත සඳහන්) නැවතත් කියවා එහි සඳහන් කර තිබෙන පාපයන්ගෙන් අඩු වශයෙන් ඔබ එක වරක් වත් කර තිබෙන සෑම එකක් යටින් ඉරක් අඳින්න.
- ඔබේ සිත දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් පූර්ණ කරන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

**යේසුස්වහන්සේ පාපයේත් යක්ෂයාගේත් බලය බිඳ හෙළන සේක.**

අප දැන සිටින අප විසින් කළ යුතු දේ කළ නොහැකි වනතෙක් පාපය නිසා අපේ ආත්ම ශක්තිය දුර්වල වී තිබේ.




**යොහන් 8 : 34** ............ පව් කරන සියල්ලෝම පාපයාගේ වහල්ලුය.

**රෝම 7 : 14, 15, 18** ............... මම මාංශිකව පාපයට විකුණනු ලැබ සිටිමි. මා කරන්නේ මම කැමති දේ නොව මා ද්වේශ කරන දේය............... කැමැත්ත මට ඇත්තේය. නුමුත් යහපත් දෙය කිරීම මට නැත්තේය.

යේසුස්වහන්සේ පාපයේ දම්වැල් කඩා නරක පුරුදුවලින් අපව මුදහරින සේක. කෝපය, සූදුව, නීචබස, අනාචාරය, ආදියෙන් හා දුම්පානයටත්, බීමත්කමටත්, ද්‍රව්‍යවලටත් ඇති ගිජුකමින් උන්වහන්සේ අපව නිදහස් කරන සේක. යක්ෂයාගේ බලය උන්වහන්සේ බිඳින සේක.

**මෙය කටපාඩම් කරන්න**

**යොහන් 8 : 36** ............ පුත්‍රයා නුඹලා නිදහස් කරන්නේ නම් සැබවින් නුඹලා නිදහස් වන්නහුය.



**යේසුස්වහන්සේ ඔබේ ස්ථානය ගත් සේක.— ඔබේ නිදහස ලබාදුන් සේක.**

දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම අනුව පාපයට දඬුවම මරණය විය. උන්වහන්සේ ඔබට කොපමණ ප්‍රේමකළසේක්ද යතහොත් උන්වහන්සේගේ පුත්‍රයාණන් ඔබේ ස්ථානය ගෙන මරණ පත්වීමට සැළැස්වූ සේක. එහෙයින් උන්වහන්සේගේ මරණය ඔබ මළාක් මෙනි. උන්වහන්සේ නැවත නැඟිට ස්වර්ගයට වැඩිය හෙයින් ඔබටත් එය කළ හැකිය.



**1 පේත්‍රැස් 2 : 24** අප පාපවලට නැසී ධර්මිෂ්ඨකමට ජීවත් වන පිණිස උන්වහන්සේම තමන්ගේ ශරීරයෙන් ගස පිටදී අපගේ පාපයන් ඉසුලූ සේක..................

**ගලාති 2 : 19,20** ඇරත් මම දෙවියන්වහන්සේ උදෙසා ජීවත්වන පිණිස ව්‍යවස්ථාව කරණ කොටගෙන ව්‍යවස්ථාවට මැරුණෙමි. මම ක්‍රිස්තුස්වහන්සේ සමඟ කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි. එසේ වී නමුත් මම ජීවත් වෙමි. නුමුත් තවත් මම නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත්වන සේක. තවද මා දැන් මාංශයෙහි ජීවත්වන ජීවිතය මට ප්‍රේම කළාවූ මා උදෙසා තමන්ම පාවා දුන්නාවූ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි.

යේසුස්වහන්සේ ඔබේ ගැළවුම්කාරයාණන් හැටියට ඔබ පිළිගත්විට උන්වහන්සේගේ මරණය ඔබේ මරණය මෙන්ද උන්වහන්සේගේ ජීවනය ඔබේ ජීවනය මෙන්ද ඔබ පිළිගන්නෙහිය. ඒ මොහොතෙහිදීම ඔබ උන්වහන්සේගේ දරුවකු වන්නෙහිය. පාපය නිසා ඔබ දෙවියන්වහන්සේගෙන් වෙන්ව සිටින්නෙහිය. නමුත් යේසුස්වහන්සේ තුළින් ඔබ කිසි දිනක පව් නොකළාක් මෙන් නිදහසද නව ජීවනයද දෙවියන් වහන්සේ සමග සහභාගිකමද ඔබට ලැබේ.

**ඔබේ අභ්‍යාසය සඳහා**

- අටවැනි පිටුව නැවත දෙවරක් කියවන්න.
- යේසුස්වහන්සේ විසින් ඔබව නොයෙක් පුරුදු වලින් මුද හැරීම ඔබට අවශ්‍ය නම් උන්වහන්සේට ඒ ගැන යාච්ඤාවෙන් කියා සිට ඔබව නිදහස් කරන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

## තුන්වැනි කොටස

# යේසුස් වහන්සේ ඔබේ ගැළවුම්කාරයාණන්ද?

### ඔබ විසින්ම එය නිරණය කරගත යුතුයි.

යේසුස්වහන්සේ ඔබේ ගැළවුම් කාරයාණන් වීමට කැමතිව සිටින නමුත් උන්වහන්සේව පිළිගැනීමට උන් වහන්සේ ඔබට බල නොකරන සේක.

### උන්වහන්සේ පිළිගැනීමට කාලය දැන්ය.

යේසුස්වහන්සේ ඔබේ ගැළවුම්කාරයාණන් හැටියට ඔබ පිළිගෙන නොමැති නම් එය දැන් කරන්න. හොඳම වෙලාව දැන්ය.

කල්දැමුවහොත් එය ප්‍රමාද වූවා වැඩිවිය හැකිය. නවද උන්වහන්සේ තුළ තිබෙන මේ අනගි නව ජීවනය හැකි තරම් දවස් ඔබට භුක්ති විඳීමට අවශ්‍ය වේ. උන්වහන්සේ ඔබේ සිතේ දොරටුවට තට්ටුකරන සේක. උන්වහන්සේට ඇතුළුවීමට ඉඩ දෙන්න.



**එළිදරව් 3 : 20** මෙන්න මම දොර ළඟ සිට තට්ටු කරමි.

**හෙබ්‍රෙව් 3 : 14** අද නුඹලා උන් වහන්සේගේ හඬ අසන්නහු නම්......
............සිත් දැඩිකර නොගනිල්ලා.

**2 කොරින්ති 6 : 2** මෙන්න දැන් පිළිගත යුතුවූ කාලයය. මෙන්න දැන් ගැළවීමේ දවසය.

**ඔබේ අභ්‍යාසය සඳහා**

යේසුස්වහන්සේ ඔබ අසළින්ම සිටින සේක. ඔබේ යාච්ඤාව උන්වහන්සේට ඇසෙන්නේය. ඔබේ පව් උදෙසා උන්වහන්සේ දිවි පිදූ හෙයින් ඔබේම වචනවලින් උන්වහන්සේට ස්තුති කර ඔබේ ගැළවුම්කාරයාණන්වන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. ඔබ එය දැනටමත් කර තිබේ නම් ඔබේ වැදගත්ම අවශ්‍යතාවය පිරිමසන ආකාරය ගැන උන්වහන්සේට ස්තුති කරන්න.

සතරවැනි කොටස

# ඔබේ අනෙකුත් අවශ්‍යතාවයන් පිරිමැසෙන්නේ කෙසේද?

**ඔබේ පියාණන්වහන්සේ ඔබ ගැන සැලකිලිමත්ව සිටින**



**මතෙව් 6 : 31 – 33** එහෙයින් කුමක් කමුද, කුමක් බොමුද, කුමක් අඳිමුද කියමින් කනස්සලු නොවෙල්ලා...... ............... මේ සියල්ල නුඹලාට ඕනෑ බව නුඹලාගේ ස්වර්ගීය පියාණන් වහන්සේ දන්නා සේක. නුමුත් පළමුකොට උන්වහන්සේගේ රාජ්‍යයද ධර්මිෂ්ඨකමද සොයාපල්ලා මේ සියල්ලත් නුඹලාට දෙනු ලබන්නේය.

**දිනපතා ඔබේ අවශ්‍යතාවයන් ගැන දෙවියන්වහන්සේට කියන්න.**

**පිලිප්පි 4 : 6** නුඹලා කිසිවක් ගැන කණගාටු නොසිතා සියල්ලෙහිදී ස්තුතිදීම සමග යාච්ඤාවෙන්ද කන්නලව්වෙන්ද නුඹලාගේ ඉල්ලීම් දෙවියන්වහන්සේට දන්වාපල්ලා.

**යේසුස් වහන්සේ ඔබේ සුවදායකයාණන් වන සේක.**

යාච්ඤාවට පිළිතුරු වශයෙන් උන්වහන්සේ අදද රෝගීන් සුව කරන සේක.



**ක්‍රියා 10 : 38** ............... යේසුස්වහන්සේ ............... සියල්ලන් සුවකරමින් හැසුරුණ සේක.

**හෙබ්‍රෙව් 13 : 8** යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඊයේත් අදත් සදකාලයටත් එකාකාරමය.

## ඔබේ අභ්‍යාසය සඳහා

උන්වහන්සේගේ සැපයීම ගැන උන්වහන්සේට ස්තුති කර ඔබට තිබෙන්නාවූ ඕනෑම ගැටළුවක් සම්බන්ධව උන්වහන්සේගෙන් උපකාර ඉල්ලන්න.

---

සතරවැනි පාඩම සම්පූර්ණ කිරීම ගැන අපි ඉතාමත් සතුටු වෙමු.

ඔබේ මෙම පාඩම් පොත් පිංව අප වෙත ලැබුණු විගස එය ශ්‍රේණිගතකර පස්වැනි පාඩම සමග ආපසු ඔබ වෙත එවන්නෙමු.

සයවැනි පාඩම සම්පූර්ණ කළ පසු අපි ඔබට අලංකාර සහතිකයක්ද පිරිනමන්නෙමු.

ඔබට දෙවියන්වහන්සේ ආශීර්වාද කරන සේක්වා!

# ඔබේ මිතුරු මිතුරියන්ගේ නම් සහ ලිපිනයන් අප වෙත එවන්න.

''ජීවිතය පිළිබඳ ප්‍රධාන ප්‍රශ්න'' නමැති පාඩම් මාලාවේ ප්‍රථම පාඩම අපි ඔවුන් වෙත යවන්නෙමු.

පැහැදිලිව ලියන්න.

1.

නම : ..........................................................

ලිපිනය : ..........................................................

..........................................................

---

2.

නම : ..........................................................

ලිපිනය : ..........................................................

---

3.

නම : ..........................................................

ලිපිනය : ..........................................................

..........................................................

ඔබේ නම : ..........................................................

ලිපිනය : ..........................................................

..........................................................

පහත සඳහන් ලිපිනයට ලියන්න.

# ජීවිතය පිළිබඳ ප්‍රධාන ප්‍රශ්න

පාඩම් පෙළ

1 ලෝකයට සිදුවීගෙන යන්නේ කුමක්ද?

2 දෙවියන් වහන්සේ පිළිබඳ සත්‍යය කුමක්ද?

3 ජීවිතය යනු කුමක්ද?

4 ඔබේ වැදගත්ම අවශ්‍යතාවය සපුරාගන්නේ කෙසේද?

5 මරණින් පසු කුමක් සිදුවේද?

6 සැබෑ ක්‍රිස්තියානි සභාව කුමක්ද?


අපේ ලිපිනය

ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය

තැ. පෙ. 102

කොළඹ.